# HSBC සමූහ ව්‍යාපාරය සංස්ථාපිත පාලන වාර්තාවේ සාරාංශය

**පහත දක්වා ඇති තොරතුරු සහ යොමු මඟින් අන්තර්ගත කර ඇති තොරතුරු 2013 වාර්ෂික වාර්තාව හා ගිණුම්වල ('වාර්ෂික වාර්තාව') 346 සිට 365 දක්වා පිටුවල අඩංගු වූ HSBC සමූහ ව්‍යාපාරය ('HSBC') සංස්ථාපිත පාලන වාර්තාවේ සාරාංශයක් වේ.**

## අධ්‍යක්ෂක මණ්ඩලය

HSBC සමූහ ව්‍යාපාර හි අධ්‍යක්ෂ මණ්ඩලය ('අධ්‍යක්ෂ මණ්ඩලය') විසින් මූලිකත්වය දරන හා සමූහ සභාපති වරයා විසින් මෙහෙයවෙන HSBC හි කළමනාකරණ ව්‍යුහයෙහි අරමුණ වන්නේ සමාගමෙහි දිගුකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම සහ අපගේ කොටස් හිමියන්ට ස්ථාවර අගයක් ලබාදීමයි. සමූහය සඳහා ක්‍රමවේදයන් හා අවදානම් ගැනීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සි දුකරන අතර, කළමනාකාරීත්වය විසින් සැලසුම් කර ඇති ක්‍රමවේදී අරමුණු ලඟාකරගැනීම සඳහා එය විසින් ඉදිරිපත් කරන ප්‍රාග්ධන හා මෙහෙයුම් සැලසුම් අනුමත කිරීම ද සිදුකරයි. නියම කරන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සමූහ කළමනාකාරීත්ව මණ්ඩලය (GMB) වෙත පැවරෙන අතර, සමූහ ප්‍රධාන විධායක විසින් ඒවා මෙහෙයවනු ලබයි.

## මණ්ඩලයෙහි බලතල

HSBC හි ව්‍යාපාර කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධ අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම විය යුතු අතර, එසේ කිරීමේදී අදාළ වන නීති හා රෙගුලාසිවලට සහ සාංගමික ව්‍යවස්ථාවලියට යටත්ව, සිය බලතල භාවිතා කරනු ඇත. මණ්ඩලය විසින් www.hsbc.com/1/2/about/board-of-directors ,හි දැක්වෙන යොමු කොන්දේසි උපයොදවාගෙන ඇත. එම යොමු කොන්දේසි මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි.

## සමූහ කළමනාකාර මණ්ඩලය (GMB)

සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් (GMB) හි සභාපතිත්වය දරනු ලැබේ. එක් එක් ගෝලීය ව්‍යාපාරයන් හා ගෝලීය කටයුතුවල ප්‍රධානීන් සහ එක් එක් කලාපයේ ප්‍රධාන විධායක නිලධාරීවරු, සාමාජිකයකු වශයෙන් හෝ ආරාධනා මත හෝ, (GMB) රැස්වීම්වලට සහභාගි වේ. සමූහය තුළ අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ මඟපෙන්වීම් කලින් කලට ස්ථාපනය කිරීමට, පවත්වාගෙන යාමට සහ සමාලෝචනය කිරීමට ජීඑම්බී විසින් සමාකාරව පවත්වනු ලබන අවදානම් කළමනාකරණ රැස්වීම්වල සභාපතිත්වය දරනු ලබන්නේ සමූහයේ ප්‍රධාන අවදානම් නිලධාරියා විසිනි. සමූහය පුරා නොවෙනස්ව යොදාගත යුතු හා පිළිපැදිය යුතු විශිෂ්ඨ ප්‍රතිපත්ති පිළිබිඹු කෙරෙන ගෝලීය ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා (GMB) විසින් විධිමත්ව පවත්වනු ලබන ගෝලීය ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ රැස්වීම්වල උප-සභාපතීත්වය සමූහයේ ප්‍රධාන අවදානම් නිලධාරියා සහ ප්‍රධාන නීති නිලධාරියා විසින් දරනු ලබයි. සමූහයේ මූල්‍ය අපරාධ අනුකූලතා ප්‍රධාන නිලධාරියා සහ සමූහයේ මුදල් විශුද්ධිකරණ වාර්තා නිලධාරියා ද එකී එක් එක් රැස්වීමට සහභාගි වේ.

## සමූහ විගණන කමිටුව (GAC)

මූල්‍ය වාර්තාකරණය ට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් දීම සහ පාලනය සම්බන්ධ විධායක නොවන අධීක්ෂණය සඳහා සමූහ විගණන කමිටුව ට විධායක නොවන වගකීම් පවතී.

## සමූහ අවදානම් කමිටුව (GRC)

ඉහළ මට්ටමේ අවදානම් හා සම්බන්ධ කරුණු පිළිබඳව හා අවදානම් පාලනය සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස්දීම සහ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පිළිබඳ විධායක නොවන අධීක්ෂණය සඳහා සමූහ අවදානම් කමිටුව වගකිව යුතු වේ (මූල්‍ය වාර්තාකරණය පිළිබඳව හැර).

## වැටුප් කමිටුව

වැටුප් ප්‍රතිපත්තිය අනුමත කිරීම සම්බන්ධයෙන් සමූහ වැටුප් කමිටුව වගකිව යුතු වේ. එහි කාර්යභාරයෙහි කොටසක් ලෙස වාර්ෂික දීමනා සැලසුම්, කොටස් සැලසුම්, වෙනත් දිගුකාලීන දීමනා සැලසුම් හා, සැලකිය යුතු බලපෑම් සහිත සියලුම තනතුරු සහ අපගේ අවදානම් පැතිකඩට වැදගත් බලපෑමක් ඇති තනතුරු ද ඇතුලුව විධායක අධ්‍යක්ෂවරුන්ගේ හා වෙනත් ජ්‍යෙෂ්ඨ සමූහ සේවකයන්ගේ තනි පුද්ගල වැටුප් පැකේජ එය විසින් සලකා බලන අතර, එසේ කිරීමේදී සමූහයේ පවතින ගෙවීම් සහ තත්ත්වයන් සලකා ද බලයි.  ස්වකීය වැටුප තීරණය කිරීම සඳහා කිසිදු අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ නොවේ.

## නාමකරණ කමිටුව

නාමකරණ කමිටුව විසින්, මණ්ඩලයේ ව්‍යුහය, ප්‍රමාණත්වය සහ සම්මිශ්‍රණය (කුසලතා, දැනුම, අත්දැකීම්, ස්වාධීනත්වය සහ විවිධත්වය ද ඇතුළුව) විධිමත්ව සමාලෝචනය කරනු ලබන අතර, කිසියම් වෙනසක් වේ නම්, ඒ පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබයි.

## සංස්ථාපිත ස්ථාවරත්ව කමිටුව

වර්ෂ 2013 තුළ දී මණ්ඩලයට, මණ්ඩලයේ කමිටුවලට සහ විධායක කලමනාකාරිත්වයට පාරිසරික, සමාජයීය සහ ආචාරධ ම වාද විෂයයන් ඇතුළු සංස්ථාපිත ස්ථාවරත්ව ප්‍රතිපත්ති පිළිබඳව උපදෙස්දීමේ වගකීම සංස්ථාපිත ස්ථාවරත්ව කමිටුව සතු විය.

මණ්ඩලයේ අභියෝජනාවක් මගින් 2013 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි කමිටුව පවරා දී ඇත. සංස්ථාපිත ස්ථාවරත්වය කමිටුව විසින් පෙර සිදු කළ බොහොමයක් කටයුතු ඉටු කිරීම පිණිස චර්යා සහ වටිනාකම් කමිටුවක් පත් කර ඇත.

## චර්යා සහ වටිනාකම් කමිටුව

2014 ජනවාරි මස මණ්ඩලය විසින් අභියෝජනාවක් මගින් ස්ථාපිත කරන ලද චර්යා සහ වටිනාකම් කමිටුවෙහි ඉලක්කය වනුයේ, HSBC විසින් සිය ව්‍යාපාර හැසිරවීමේ දී තම ගනුදෙනුකරුවන්ට සාධාරණව සහ විවෘතව කටයුතු කරන බව, නිවැරදි සේවාදායකයන් සමග නිසි ආකාරයට ව්‍යාපාර කටයුතුවල නිරත වන බව, අනෙකුත් පරදුතබන්නන් හට HSBC විසින් සාධාරණව සලකමින් හා මෙහෙයුම් කටයුතු සිදුකරමින් ප්‍රජාවන් කෙරෙහි වගකීමෙන් ක්‍රියා කරන බව සහතික කිරීමයි.

## අභ්‍යන්තර පාලන

HSBC හි අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සඵලතාවය පවත්වාගෙන යාම සහ සමාලෝචනය කිරීම පිළිබඳව මෙන් ම ක්‍රමෝපාය අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී මුහුණදීමට සූදානම් වන සැලකිය යුතු අවදානම්වල ස්වභාවය හා ප්‍රමාණත්වය නිශ්චය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු වගකිව යුතු වේ. මෙම අවශ්‍යතා සපුරාලීමට හා අවසර නොලත් භාවිතය හෝ ව්‍යපහරණයට එරෙහිව වත්කම් ආරක්‍ෂා කිරීම සඳහා FCA සහ PRA විසින් නිර්මාණය කර, නිකුත් කරන ලද නීතිරීති සහ මග පෙන්වීම් අත්පොත යටතේ දක්වා ඇති කාර්ය පටිපාටීන් වලට අනුව සිය වගකීම් ඉටු කරමින්, අනවසර භාවිත හා බැහැර කිරීම්වලට එරෙහිව වත්කම් ආරක්ෂා කරගැනීම යථා ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම ව්‍යාපාරය තුළ භාවිත කරනු ලබන හෝ ප්‍රකාශයට පත්කරනු ලබන මූල්‍ය තොරතුරුවල විශ්වසනීයත්වය හා වැඩදායක බව සහතික කිරීම එමගින් සිදු කළ යුතු වේ. භෞතික අවප්‍රකාශ, දෝෂ, හානි හෝ වංචාවලට එරෙහිව සාධාරණ සහ ඒකාන්ත නොවන ආරක්‍ෂණයක් මෙම කාර්ය පටිපාටීන් හට සැපයිය හැකි ය.

## මූල්‍ය වාර්තාකරණය

2013 වසරේ සංයුක්ත වාර්ෂික වාර්තාව හා ගිණුම් සැකසීම සඳහා වන සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාදාමය, සෑම වාර්තාකරණ කාලසීමාවක් ම අවසානවීමට පෙරාතුව සමූහ මූල්‍ය අංශය විසින් සමූහය තුළ ඇති සියලුම වාර්තාකරණ ආයතන වෙත නිකුත් කරනු ලබන වාර්තාකරණ අවශ්‍යතා සම්බන්ධව සවිස්තර උපදෙස් හා මඟපෙන්වීම් සහිත ගිණුම් වගුවකින් සහාය ලැබෙන ලේඛනගත ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයෙන් පාලනය වේ.

## හෙළිදරවු කිරීමේ කමිටුව

HSBC සමූහ ව්‍යාපාර විසින් කිසියම් භෞතික දෝෂයක්, අවප්‍රකාශයක් හෝ මග හැරීමක් සම්බන්ධයෙන් සිදු කරන ලද ප්‍රසිද්ධ භොතික හෙළිදරවු කිරීම්, හෙළිදරවු කිරීමේ කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. සමූහයේ සමාගම් ලේකම්වරයා විසින් සභාපතිත්වය දරන හෙළිදරවු කිරීමේ කමිටුවේ සාමාජිකත්වයට ග්ලෝබල් ෆිනෑන්ස් හි ප්‍රධානීන්, නීති, අවදානම් (මූල්‍ය අපරාධ අනුකූලතාව සහ නියාමක අනුකූලතාව ඇතුළුව), සන්නිවේදන, ආයෝජන සබඳතා සහ අභ්‍යන්තර විගණන කාර්ය සහ ප්‍රධාන කලාප සහ ගෝලීය ව්‍යාපාරවල නියෝජිතයන් ද ඇතුළත් වේ. හෙළිදරවු කිරීම්වල පූර්ණත්වය, ගෝලීය ව්‍යාපාරයන්, ගෝලීය කාර්යයන් සහ ඇතැම් නෛතික ස්ථිතීන් හි ප්‍රධානීන් විසින් ඌණපූරණය කරමින් සහතික කළ උග්‍ර විශ්ලේෂණාත්මක මූල්‍ය වාර්තාකරණ විශේෂඥ සමාලෝචනයන්ගේ සහය සහිතව ගෝලීය මූල්‍ය සහ අවදානම් කාර්ය පටිපාටීන් සහ ව්‍යුහයන් තුළින් තහවුරු කෙරේ.

ශ්‍රී ලංකාවේ ද හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් (ලිමිටඩ්) විසින් නිකුත් කරන ලදි. AAA *(lka)* ෆිච් සහතිකයක් ලබා ඇත.